

# නිලවරණයක අලකලංචිය සාධාරණය ඔලුවෙන් සිටවීම

3zzz සිංහල ගුවන් විදුලි සේවයේ වාර්ෂික මහසභා රැස්වීම අගෝස්තු 22 දින පැවැත්වින. එදින රැස්වීම හෙබවූ ආකාරය ඉතාම කණගාටුදායකය. එකම අලකලංචියක් වූ මේ රැස්වීම ගැන සයමක් ලියන්නට සිතුවේ මේ ආකාරයේ අරුම පුදුම රැස්වීමක් මා කිසි දිනෙක දැක නැති නිසා ය.

ප.ව.2 ට ආරම්භ වීමට තිබූ රැස්වීම ආරම්භ කරන ලද්දේ ප.ව. 3 ද පසුවය.
මෙදින සිදුවූ අරුම පුදුම කරුණක් නම් රැස්විම ආරම්භ කිරීමටත් පෙර ඇතැම් සාමාජිකයින් තම ඡන්දය පාවිච්චිකොට නිවෙස් බලාද ගොස් සිටීමයි. සභාව ආරම්භ වන්නටත් පෙරම නිලධාරීන් අස්වන්නටත් පෙරම ඡන්දයක්

***<u>තිස්ස දෙවේලේ සැම තැනදීම හමුවන තමන්ගේම ශ්‍රී ලාංකික සහෝදරයන්ට එරෙහිව විජාතිකයාට හුරේ දැමූ මේ මෝඩ මිනිසුන් දැන්වත් තමන් කළ පහත් ක්‍රියාව පිලිබඳව කල්පනා කළ යුතු ය.</u>***

පැවැත්වීමේ අදහසක් සභාවෙන් සම්මත වන්නටත් පෙරම කඩිමුඩියේ ඡන්ද පත්‍රිකා බෙදා හැර ඔවුන් ගෙනැවිත් තිබූ පෙට්ටියකට ඡන්ද පත්‍රිකා ඇතුල් කරද හමාර වී තිබුණි. මේ පෙට්ටිය කල් ඇතිව පුරවා තිබුණේ ද යන්න දන්නේ ද දෙවියන් පමණි. මේ නීති විරෝධී ක්‍රියාව සිදුවෙමින් පවතිද්දී මාත් ජගත් ජේ එදිරිසිංහ මහතාත් 3ZZZ ආයතනයෙන් පැමිණ සිටි විජාතික නිලධාරියා හමුවී මෙය නීති විරෝධී ක්‍රියාවක් බැවින් මෙය නැවැත්විය යුතු යයි දන්වා සිටි විට ඔහු කීවේ එය කොමිටියේ තීරණයක් බැවින් තමන්ට කරන්නට දෙයක් නැති බව ය. ඡන්ද පත්‍රිකාව හැදුවේත් කොමිටියේ අය බව ඔහු කීවේ ය. දැනට වැටී ඇති ඡන්ද නීත්‍යානුකූල හෝ නීති විරෝධී හෝ වේවා එය තමන්ට ප්‍රශ්නයක් නැති බවත් සභාවේ අය කියන්නේ නම් දැනටමත් දමා ඇති සියලු ඡන්ද නීත්‍යානුකූල ලෙස තමන් බාර ගන්නා බවත් ඔහු කීවේ සිය පක්ෂග්‍රාහී බව මනාව ඔප්පු කරමින් ය.

නව කණ්ඩායමක් නිළවරණය සඳහා ඉදිරිපත්ව සිටි අතර ඒ වනවිට ගුවන් විදුලිය කරමින් සිටි කමිටුවේ අයද ඒ සඳහා ඉදිරිපත්ව සිටියහ. අප සමාජය ගුවන් විදුලියක් නිසා දෙකඩවීම අනවශ්‍ය බව පවසමින් මේ කණ්ඩායම් දෙකෙන්ම දක්ෂයින් තෝරා එක් කණ්ඩායමක් සෑදීම සුදුසු බවට ඊට පෙරාතුවම යෝජනා ඉදිරිපත්ව තිබින. එහෙත් එවැන්නකට අවකාශ නොවීය. බලයේ සිටි කණ්ඩායමට අවශ්‍ය වූයේ හොඳින් හෝ නරකින් හෝ තමන්ම නැවත වතාවක් බලය ලබාගනිමින් තවත් වසර දෙකක්

රත්නපාල දිසානායක

ගුවන්විදුලිය පවත්වාගෙන යාමය. සහයෝගයෙන් එක්සත් වී හොඳ ගුවන් විදුලියක් කරනවාය යන අදහස වෙනුවට කෙසේ හෝ තමන්ගේ බලය රැක ගැනීම ඔවුන්ගේ අභිප්‍රාය විය.
ඒ වන විට කැඳවුම්කරු වශයෙන් සිටි විල්ෆ්‍රඩ් සිරිවර්ධන කථාකරමින් තමා ඉතා හොඳ ගුවන් විදුලි සේවයක් පවත්වාගෙන ගිය බවත් ඒ ගැන සිතා බලා නැවතත් ඔහු ඇතුලු කණ්ඩායම නැවත වතාවක් පත්කරණ ලෙසත් සභාවෙන් ඉල්ලා සිටිමින් ඉහත කී විජාතික නිළධාරියාට සභාවේ කටයුතු පවත්වාගෙන යන ලෙස ඉල්ලා සිටියේය.

සම්ප්‍රදායන්ට හා ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධව මෙදින කටයුතු සිදුවිය. සිංහල ප්‍රජාවට අයිති රැස්වීම එදින 3zzz ගුවන් විදුලියේ ප්‍රධාන කාර්යාලයෙන් පැමිණ සිටි විජාතික නිළධාරියාට විකුණාන ලදී.

සාමාන්‍ය පිළිගත් සම්ප්‍රදාය නම් වර්තමාන නිළධාරීන් ඉල්ලා අස්වුන පසු නව නිළධාරීන් පත්කරන තුරු සභාවේ කටයුතු තාවකාලික සභාපතිවරයකුට පැවරීමය. සභාවේ සිටින සියල්ලටම පිලිගත හැකි ස්වාධීන වගකිව යුතු පුද්ගලයකු තාවකාලික සභාපතිවරයා ලෙස

***<u>දූෂ්‍ය කරන ලද සිත් ඇති අපේම මිනිසු-න් විජාතිකයා දුන් කඩුවෙන් සියතින් ගෙල සිඳගත්තේ ඒ ආකාරයටය.</u>***

පත්කරගැනීම මීට පෙරාතුව පැවැත්වූ 3zzz සිංහල අංශයේ රැස්වීම් සියල්ල තුල සිදුවූවද එම පිළිගත් සම්ප්‍රදාය මෙදින ක්‍රියාත්මක නොවීය. තාවකාලික සභාපතිවරයා ලෙස පත් කර ගැනීමට සුදුසු කම් ඇති සමාජය පිලිගත් දසරත් ජයසූරිය රවි කරවිදෙනිය ඩී බී කුරුප්පු වැනි මහත්වරුන් සභාවේ සිටියදී ඔවුන් නොසළකා හැර විජාතිකයකුට සභාව බාර දීමේ යටි අරමුණ කුමක්ද යන්න තේරුම් ගැනීම අපහසු නැත.

තාවකාලික සභාපතිවරයෙකු පත්කිරීමේ අවශ්‍යතාව මා පෙන්නා දුන්නද ඉහත කී නිළධාරියා ඊට එකඟත්වය පළ නොකලේය. නැවතත් කල ඉල්ලීම අනුව ඊට අකමැත්ත පෙන්-වමින් තාවකාලික සභාපතිකෙනෙකු අවශ්‍යදැයි යන්න සභාවෙන් විමසීය. තාවකාලික සභාපතිකෙනෙකු අවශ්‍ය නැති බව පෙන්වමින් වැඩි ප්‍රමාණයක් අත් ඉහළ ගොස් නිළධාරියාගේ කැමැත්තට ඉඩ ලැබින. දූෂ්‍ය කරන ලද සිත් ඇති අපේම මිනිසුන් විජාතිකයා දුන් කඩුවෙන් සියතින් ගෙල සිඳගත්තේ ඒ ආකාරයටය. තිස්ස දෙවේලේ සැම තැනදීම හමුවන තමන්ගේම ශ්‍රී ලාංකික සහෝදරයන්ට එරෙහිව විජාතිකයාට හුරේ දැමූ මේ මෝඩ මිනිසුන් දැන්වත් තමන් කළ පහත් ක්‍රියාව පිලිබඳව කල්පනා කළ යුතු ය. සිංහල ජනතාවට ඇති අයිතිය විජාතිකයෙකුට විකුණුවේය යනුවෙ-න් මුලදි මා සඳහන් කලේ ඒ නිසාය.

දෙවන නාඩගම ඇරඹුනේ ඉන්පසුවය. අප විමතියට පත්කරමින් එම නිළධාරියා සෘජුවම ඡන්දයක් පැවැත්වීමට උත්සාහ කළේය. මෙහිදී සාලිය ගලප්පත්ති මහතා නැගී සිට පිල් බෙදීමක් අවශ්‍ය නැති බවත් කණ්ඩායම් දෙකෙන්ම වඩා සුදුස්සන් තෝරා එක් කණ්ඩායමක් ඉදිරිපත්වීම සුදුසු බව ප්‍රකාශ කිරීමේදී ඇතැම් සංවිධානාත්මක පිරිසක් ඔහුට හූ කියන්නට පටන්ගති. සභාවේ අදහස් දක්වන්නන්ට හූ කියා බාධා කරන්නට පිරිසක් කල් තබාම සූදානම් කර තිබූ බව අපි දැන සිටියෙමු. මේ පහත්පෙලේ ක්‍රියාව අනුමත නොකළ පිරිසක් ශාලාවෙන් පිටව යනු මම දුටිමි.

අනතුරුව පෙරකී විජාතික නිළධාරියා නාමයෙ-ජ්පනා දී තිබූ අයගේ නම් කථා කොට එක් අයකුට විනාඩි 2 ක පමණ කාලයක් ලැබෙන බවත්, එකිනෙකා තම තමා ගැන හැඳින්වීමක් කරන ලෙසත් නියෝග කළේ ය.

නාම යෝජනා නමේ මුල් අකුරේ පිළිවෙලට (අකාරාදි පිළිවෙළට) සකස් කර නොතිබුන අතර වර්තමාන කමිටු සාමාජිකයින්ගේ නම් මුලට තිබුන අතර ඒ සැමදෙන පැමිණ තමාට ඡන්දය පාවිච්චි කරන ලෙස ඉල්ලා සිටියෝය. ඉන්පසු අලුතෙන් ඉදිරිපත් වූ කණ්ඩායමේ නම් අනුව ප්‍රසන්න කුරුකුලරත්න පැහැදිලි කිරීමක් කරමින් තමා ඇතුලු කණ්ඩායම ඡන්දයකට නොගොස් නාමයෝජනා ඉල්ලා අස්කරගන්නා බව පැවසීය. සිංහලෙන් පැවසූ දේ නොතේරුනු පෙරකී විජාතික මහතා අනිකුත් අපේක්ෂකයින්ගේ නම් ද කැඳවන්නට විය. අප ඉල්ලා අස්වුන බව ඔහුට තේරුම්කර දුන්නද සියලු දෙනාට අවස්ථාව ලබාදිය යුතු බව පවසමින් ලැයිස්තුවේ ඇති නම් කතා කිරීම දිගමට කරගෙන ගියේ ය. ඒ අනුව නගඑගෑග ප්‍රනාන්දු මහතාගේ වාරයේදී ඔහු ඉදිරිපත්ව ගොස් 3zzz ප්‍රධාන කාර්යාලයෙන් පැමිණි පෙරකී මහතා පක්ෂග්‍රාහීව සහ ප්‍රජාතන්ත්‍රවිරෝධීව සභාව මෙහෙයවන ලද බව ඉංග්‍රීසියෙන් ප්‍රකාශ කොට තම කතාව සිංහලෙන් කරගෙන යන ලදී. මෙහිදීද පෙරකී නොහැදුනු සංවිධානාත්මක පිරිස නගඑගෑග මහතාටද බාධා පැමැණවීමට උත්සාහ කළ අතර තමාගේ කථාවට බාධා නොකර සවන් දී සිටින ලෙස ඔහු දැන්විය.

අලුත් කණ්ඩායමේ සියල්ලන් සිය නාමයෝජනා ඉල්ලා අස්කර ගැනීම නිසා ගුවන් විදුලියේ හිටපු කණ්ඩායම නිතරග ජයක් ලැබීය.

3zzz ගුවන් විදුලිය අප සමාජය සතු පොදු ගුවන් විදුලියයි. එය සැමටම එකසේ සළකන සැමටම එකසේ අවස්ථා සළසන ගුවන් විදුලියක් විය යුතු ය. ගුවන් විදුලියට එක්-වන්නට කැමැත්ත හා හැකියාව ඇති විශාල පිරිසක් එළියේ සිටියදී ඔවුන්ට අවස්ථාවක් නොදී ඒ අයට දොර වසා දමා මිනිසුන් තුන් හතර දෙනෙකුට පමණක් ගුවන් විදුලියේ දොර ඇර දුන් මේ ක්‍රියාවලිය කොයි තරම් අසාධාරණද යන්න මොළය කළඳක් හෝ ඇති ඕනෑම අයෙකුට තේරුම් යනු ඇත.
කල්ලිවාදය මුදල හා තර්ජන ගර්ජන මතින් සිදු කරන ලද මේ පහත් ක්‍රියාව මෙල්බර්න් ශ්‍රී ලාංකික සමාජයේ බුද්ධිමත් සියලු දෙනාගේම විමතියට හා කළකිරීමට හේතු වන බව නිසැක ය.

■

LANKAN AUTO CARE

Licensed Roadworthy Tester (R.W.C)



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




Ranjith Perera
Mob: 0409 866 886

9798 2200

14/30 Tower Court
Noble Park 3174